# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / Fax: (94)-11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
Date: 2012.02.16

අයවැය චක්‍රලේඛ අංක : 156

අමාත්‍යාංශ ලේකම්වරු/පළාත් සභා ප්‍රධාන ලේකම්වරු/දෙපාර්තමේන්තු ප්‍රධානීන්/
දිස්ත්‍රික් ලේකම්වරු/ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරු,

**ඉන්ධන / විදුලි වියදම් කළමනාකරණය**

දේශීය වෙළඳ පොලේ ඉන්ධන මිල හා විදුලි ගාස්තු සංශෝධනය කිරීම තුළ එම වියදම් කළමනාකරණය කරමින් රජයේ ආයතන සියල්ල විදුලිය හා ඉන්ධන පරිභෝජනය අරපරිස්සමින් කිරීමට මූලිකත්වය දීම ජාතික වගකීමක් වී ඇත. මෙම මිල ගණන් වැඩි කිරීම තුළ අපේක්ෂිත මූලික අරමුණ වන්නේ ඉන්ධන හා විදුලිය පාවිච්චිය සඳහා වාර්ෂිකව වැයවන තෙල් ආනයනය සඳහා වූ විදේශ විනිමය ඉතුරු කර ගැනීමත්, විකල්ප බලශක්ති මාර්ග සඳහා වැඩි අවධානයක් යොමු කරමින් දේශීයව මෙම පහසුකම් වැඩිදියුණු කර ගැනීමත් හා දිගුකාලීනව ඉන්ධන/විදුලිය කාර්යක්ෂම තාක්ෂණික ක්‍රම කෙරෙහි පරිභෝජන හා නිෂ්පාදන අංශ යොමු කිරීමත්ය.

02. අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සංස්ථා ව්‍යවස්ථාපිත ආයතනද මෙම භාණ්ඩ පරිභෝජනයේ විශාල කොටසක් ආවරණය වන බැවින් රාජ්‍ය අංශය තුළ මෙම වියදම් අවම කර ගැනීමට අනුගමනය කරන අරපිරිමැසුම් මාර්ග වලින් වියදම් අවම කර ගැනීම සමස්ත රාජ්‍ය අංශයේ වියදම් අඩු කර ගැනීමට පමණක් නොව අනෙකුත් අංශවලට ආදර්ශයක්ද වනු ඇත. එබැවින්, ඉන්ධන හා විදුලිය ආශ්‍රිත වියදම් පාලනය සඳහා වඩා ඵලදායී ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙස මෙයින් අවධාරණය කරමි.

03. ඒ අනුව, 2012 වර්ෂයේ ඉන්ධන හා විදුලිය සඳහා සලසා දී ඇති ප්‍රතිපාදන සීමාව ඇතුළත අදාල වියදම් කළමනාකරණය කරගත යුතු අතර, 2012 ජනවාරි මාසය තුළ මේ වෙනුවෙන් කරන ලද වියදම මත පදනම්ව, එම සීමාව නොඉක්මවන පරිදි, ඉදිරි මාසවල දී මාසික වියදම පවත්වාගෙන යාමට ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතු ය. මේ සඳහා කිසිදු අතිරේක ප්‍රතිපාදන ලබාදීමක් හෝ මුදල් රෙගුලාසි ප්‍රතිපාදන යටතේ කිසිදු මාරු කිරීමක්, 2012 වර්ෂය තුළ දී භාණ්ඩාගාරය විසින් අනුමත නොකරන බව ද අවධාරණය කරමි.

04. ඒ සඳහා සියළුම රාජ්‍ය ආයතනවල දෛනික කාර්යාල කළමනාකරණයේ දී, ක්ෂේත්‍ර රාජකාරි, සම්මන්ත්‍රණ හා වැඩමුළු ඇතුළු කටයුතු සඳහා භාවිතා කරන සංචිත වාහන සංඛ්‍යාව අවම කොට අනවශ්‍ය වියදම් සිදුනොවන පරිදි කටයුතු කළයුතු ය.

05. එසේම, ඉන්ධන, විදුලිය, වායු සමීකරණ වැනි වියදම් අවම වනසේ අරපිරිමැස්මෙන් කටයුතු කෙරෙන බවට ගණන්දීමේ නිලධාරීන් හා ප්‍රධාන් ගණන්දීමේ නිලධාරීන් විසින් පෞද්ගලිකවම අධීක්ෂණය කිරීමට හා අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට අවශ්‍ය විධිවිධාන යෙදීමට වගබලා ගත යුතු ය.

06. එබැවින්, පහත සඳහන් ක්‍රියාමාර්ගවලට උපරිම ලෙස අනුකූල වීමට කටයුතු කරන ලෙස ඉල්ලමි.

- 2012 මාර්තු මස සිට ඉන්ධන හා ප්‍රවාහන මාසික වියදම 2012 ජනවාරි මස වියදමට උපරිම ලෙස සීමා කිරීම හා ඒ පිළිබඳ අදාළ ආයතන ප්‍රධානියා වගබලා ගැනීම.
- විදුලිබල මණ්ඩලය විසින් යෝජනා කර ඇති පරිදි පෙ.ව. 10.00 දක්වාත්, ප.ව. 3.00 පසුවත් වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියා විරහිත කිරීම වැනි ක්‍රියාමාර්ග මඟින් විදුලිය අරපිරිමැස්ම.
- වාහන පාවිච්චි කිරීමේදී හැකි තරම්දුරට කණ්ඩායම් වශයෙන් යොදා ගැනීම.
- දැනට ක්‍රියාත්මක වන ඉන්ධන දීමනාවන් දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම.
- ඉන්ධන හා විදුලිය අරපිරිමැසීමට අමතරව දිනපතා පුවත්පත් මිලදී ගැනීම්, දුරකථන බිල්පත්, විවිධ උත්සව මෙන්ම ඒ සඳහා ආරාධනා පත්, දින පොත්, සුභපැතුම් පත් වැනි අත්‍යාවශ්‍ය නොවන ක්‍රියාකාරකම් සඳහා කරනු ලබන වියදම්ද සීමා කිරීම.
- ආයතනයේ කාර්ය මණ්ඩලයේ සංවේදිත්වය ඉන්ධන/විදුලි අරපිරිමැස්ම කෙරෙහි යොමු කරමින් ආයතනයට සුවිශේෂී ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ සාමූහික ප්‍රයත්නයන් ගැනීම.

07. ඉන්ධන හා විදුලිය අරපිරිමැස්මෙන් පරිහරණය කිරීමත් විශේෂ වියදම් කළමනාකරණය පිළිබඳව සමස්ත රාජ්‍ය අංශයෙන් ලැබෙන සහාය සහ ආදර්ශයන් අතිශයින් අගය කරමි.

පී.බී. ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත් : 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
04. විගණකාධිපති